# වැවිලි අමාත්‍යාංශය

**පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා**
**ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන**
**විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

## පොල් වගාකිරීමේ මණ්ඩලය

## තනතුරු පුරප්පාඩු - 2021

**පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් සේවාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### තනතුර : සහකාර කළමනාකරු (සිවිල්) - වතු II ශ්‍රේණිය

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී ඉංජිනේරු (සිවිල් ) උපාධියක්

හෝ

II. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

හෝ

III. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර හතර (04) ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

IV. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාමික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් කාණ්ඩය :** JM1-2

**වැටුප් පරිමාණය :** රු. 43,355- 755X10 - 1135X18 - 71,335

**වයස :** අවු : 22 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ තියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් කොන්දේසි :**

I. සෑම ඉල්ලුම්කරුවෙක්ම, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- ජීව දත්ත හා අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් විස්තර හා පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි **සහතිකවල පිටපත්** සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. තවද, දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.)
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ **ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර** සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන්කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සියලුම අයදුම්පත් 2021.05.14 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතිෂ්ප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සළකා කටයුතු කරනු ලැබේ.

**සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය,**
**9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

Source: Dinamina, Daily News (2021.04.30)